නීතිපති නිල මැදිරිය
කොළඹ 12, ශ්‍රී ලංකාව.
சட்டத்துறை அதிபதியின் கூடம்
கொழும்பு 12, இலங்கை.
Attorney-General's Chambers
Colombo 12, Sri Lanka.

දුරකථනය / தொலைபேசி / Telephone: 2327166
ෆැක්ස් / ඊ-මේල් / தொலைநகல் / Fax/E-mail: 2381171
ag@attorneygeneral.gov.lk

09 NOV 2020

RECEIVED
09 NOV 2020
Secretary's Office
Ministry of Justice

මගේ අංකය: CR3/MISC/08/2019
ඔබේ අංකය: STAFF/03/1GP/OUT/LEG/1127/20

2020.11.09

සී.ඩී.වික්‍රමරත්න මහතා,
වැඩ බලන පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**<u>මත්ද්‍රව්‍ය වැරදි සඳහා නඩු පැවරීම හා ඊට අනුෂාංගික කරුණු</u>**

උක්ත කාරණය සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන නීති උපදේශක ජනාධිපති නීතිඥ යූ.ආර්. ද සිල්වා මහතා, නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා සහ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහත සමග 2020.11.06 වන දින පැවති සාකච්ඡාව සහ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් යොමු අංක MOJ/L2/6/44 යටතේ 2020.11.09 දාතමින් මා වෙත යොමු කරන ලද ලිපිය හා බැඳේ. (ගරු අධිකරණ අමාත්‍යවරයාගේ ලිපියේ පිටපතක් "ඇමුණුම 1" වශයෙන් මෙයට අමුණා ඇත.)

මේ වන විට ව්‍යාප්ත වෙමින් පවතින කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් බන්ධනාගාරයන් තුළ රඳවා සිටින රැඳවියන් හට ද එකී වෛරසය ආසාදනය වී සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමේ අවධානමක් ඇති බව මා වෙත ඉදිරිපත් කරන ලද කරුණු කෙරෙහි අවධානය යොමු විය. ඒ අනුව, මේ වන විට බන්ධනාගාරයන් තුළ රඳවා සිටින රැඳවියන් ප්‍රමාණය අවම කිරීම සඳහා මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරයේ රඳවා සිටින රැඳවියන් ඉහළ ප්‍රමාණය (10700 කට අධික ප්‍රමාණයක්) සලකා බැලීමෙන් පසුව අධිකරණයන් ඉදිරියේ පවත්නා මත්ද්‍රව්‍ය වැරදි වලට සම්බන්ධ පුද්ගලයන්ට අවස්ථාවෝචිත සහ සුදුසු පරිදි ඇප ලබා ගැනීම ඉක්මන් කිරීම සිදු කල යුතු කාර්යයක් බව පෙනේ.

සියලු අවස්ථානුගත කරුණු සැලකීමේ දී ප්‍රස්තුත කාරණය සම්බන්ධයෙන් ඉහත සමාංක සහිතව මා විසින් 2020.05.29 වන දින සහ 2020.09.08 දාතමින් ඔබ වෙත නිකුත් කරන ලද

උපමාණයන් පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව ක්‍රියාත්මක කල යුතු බවට මෙයින් උපදෙස් දෙමි.

### ඩයිඇසිටයිල් මෝර්ෆීන් නොහොත් හෙරොයින් සම්බන්ධයෙන් නඩු පැවරීම

1. රජයේ රස පරීක්ෂක වාර්තාව අනුව, ශුද්ධ බර මිලි ග්‍රෑම් 1000 හෝ ඊට වැඩි සියලුම නඩු මහාධිකරණයේ අධි චෝදනා ඉදිරිපත් කිරීම සලකා බැලීම සඳහා සම්පූර්ණ කරන ලද විමර්ශන උධෘත ගොනු නීතිපතිවරයා වෙත යොමු කළ යුතු බවට උපදෙස් දෙමි.

2. පහත අවස්ථාවේ දි විමර්ශන උධෘත ගොනු නීතිපතිවරයා වෙත යොමු කිරීම අවශ්‍ය නොවන අතර, 1984 අංක 13 දරන පනත මගින් සංශෝධිත විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ පනතේ 78(5)(අ) වන වගන්තිය ප්‍රකාරව සැකකරුවන්ට විරුද්ධව නඩු පිළිබඳ කරුණු අදාල මහේස්ත්‍රාත් අධිකරණයන්ට වාර්තා කර නඩු පැවරීමට පොලිසිය විසින් පියවර ගත යුතු ය.

    (i) රජයේ රස පරීක්ෂක වාර්තාව අනුව, හෙරොයින් ශුද්ධ බර ප්‍රමාණය (Net Weight) මිලි ග්‍රෑම් 1000 කට වඩා අඩු වන අවස්ථා වල දී හා අදාළ සැකකරු ප්‍රථම වතාවට චෝදනා ලැබ සිටින අවස්ථාවක දී (First Offender)

    (ii) හෙරොයින් බවට සැක පිට අත්අඩංගුවට ගන්නා ද්‍රව්‍යයෙහි දළ බර ප්‍රමාණය (Gross Weight) ග්‍රෑම් 02 කට වඩා අඩු වන අවස්ථා වල දි.
    (ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් රජයේ රස පරීක්ෂකවරයාගේ මතය දැක්වෙන ලිපියේ පිටපතක් "ඇමුණුම 2" වශයෙන් මෙයට අමුණා ඇත.)

කෙසේ වෙතත්, ඉහත 2(i) සහ 2(ii) යන අවස්ථාවන්ට අදාළ ශුද්ධ හෙරොයින් හි බර ප්‍රමාණය (Net Weight) මිලි ග්‍රෑම් 1000 ට අඩු වන අවස්ථා වල දි වුව ද, පහත තත්ත්වයන් යටතේ මහාධිකරණයේ අධි චෝදනා පත්‍ර ගොනු කිරීම සලකා බැලීම සඳහා සම්පූර්ණ කරන ලද උධෘත ගොනු නීතිපතිවරයා වෙත යොමු කල යුතු ය.

(අ) මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම පිළිබඳ පැහැදිලි සාක්ෂි ඇති සහ/හෝ

(ආ) මත්ද්‍රව්‍ය සම්බන්ධව පෙර වැරදි ඇති සහ/හෝ

(ඇ) මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවතින නඩු 03ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇති තැනැත්තන් පිළිබඳ නීති කෘත්‍යයන්

ඉහත සඳහන් (ආ) සහ (ඇ) අවස්ථාවන්ට අදාළ පෙර වැරදි සහ/හෝ පවතින නඩු ඇබ්බැහිවූවන් භාවිතා කරන හෙරොයින් ප්‍රමාණයන්ට (Not being User Quantities) අදාළ නොවන අතර සැලකිය යුතු හෙරොයින් බර ප්‍රමාණයන්ට, (Substantive Quantities) එනම්, හෙරොයින් ශුද්ධ බර ග්‍රෑම් 01 ක් හෝ ඊට වැඩි වන අවස්ථාවන්ට පමණක් අදාළ විය යුතු ය.

<u>කැනබිස් සැටයිවා එල් නොහොත් ගංජා සම්බන්ධයෙන් නඩු පැවරීම</u>

අත්අඩංගුවට ගනු ලබන ගංජා ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 05 ට අඩු වන අවස්ථා වල දී ඒ සම්බන්ධයෙන් අදාළ විමර්ශන උධෘත ගොනු නීතිපතිවරයා වෙත යොමු කිරීම අවශ්‍ය නොවන අතර, 1984 අංක 13 දරන පනත මගින් සංශෝධිත විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ පනතේ 78(5)(අ) වන වගන්තිය ප්‍රකාරව සැකකරුවන්ට විරුද්ධව නීති කෘත්‍යයන් අදාළ මහේස්ත්‍රාත් අධිකරණයන්හි පැවරීමට පොලිසිය විසින් පියවර ගත යුතු ය.

කෙසේ වෙතත්, අත්අඩංගුවට ගනු ලබන ගංජා ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 05 ට වැඩි වන අවස්ථා වල දී සහ අදාල ගංජා වල බර ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 05 ට වඩා අඩු වුව ද, පැහැදිලි කිරීමට යටත්ව ඉහත දක්වන ලද (අ), (ආ) සහ (ඇ) අවස්ථාවන් යටතට ඇතුළත් වන්නේ නම්, මහාධිකරණයේ අධි චෝදනා පත්‍ර ගොනු කිරීම සලකා බැලීම සඳහා සම්පූර්ණ කරන ලද උධෘත ගොනු නීතිපතිවරයා වෙත යොමු කල යුතු ය.

දප්පුල ද ලිවේරා
ජනාධිපති නීතීඥ
නීතිපති

**දප්පුල ද ලිවේරා**
**ජනාධිපති නීතිඥ**
**නීතිපති**

පිටපත් :

1. ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, කොළඹ 12.
2. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව, කොළඹ 12.
3. රජයේ රස පරීක්ෂක, රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
4. අධ්‍යක්ෂ (නීති), පොලිස් මූලස්ථානය, කොළඹ 01.
5. අධ්‍යක්ෂක, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, කොළඹ 01.
6. සුරාබදු කොමසාරිස්, සුරාබදු දෙපාර්තමේන්තුව, රාජගිරිය.
7. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 08.

ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි, පා. ම.
ஜனாதிபதி சட்டத்தரணி எம். யூ. எம். அலி ஸப்ரி, பா.உ.
**M. U. M. Ali Sabry, M.P., President's Counsel**
අධිකරණ අමාත්‍ය
நீதி அமைச்சர்
**Minister of Justice**

මගේ අංකය / எனது இல. / My No: MOJ/L2/6/44
ඔබේ අංකය / உமது இல. / Your No:
දිනය / திகதි / Date: 09.11.2020

Hon. Dappula De Livera P.C.
Attorney General
Attorney General's Chambers

**RE: REMAND PRISON INMATES CHARGED FOR DANGEROUS DRUGS OFFENCES**

I write in furtherance to the discussion the Chief Legal Advisor, Mr. U. R. de Silva, P.C. had with you on 06.11.2020, pertaining to the above matter subsequent to a preliminary meeting held on 05.11.2020 with the Commissioner General of Prisons, Mr. Ajith Rohana, DIG and other relevant officials on the subject that the Prisons being overcrowded and administration during Covid-19.

As it was discussed with various parties at the said meeting, I'm grateful if you could design a mechanism to differentiate the drug addicts and drug traffickers with a view to expeditiously conclude the bail inquiry and filing of charges which will eventually help us to reduce the unprecedented overcrowding of remand prisons.

M.U.M. Ali Sabry, P.C.
Minister of Justice

*Cc:*

1. Mr. C.D. Wickramaratne
   Inspector General of Police (Acting)
2. Mr. Ajith Rohana, AAL
   Deputy Inspector General of Police
3. Mr. H.M.T.N. Upuldeniya
   Commissioner General of Prisons

උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12. மீயுயர் நீதிமன்றக் கட்டிடத் தொகுதி, கொழும்பு 12. Superior Courts Complex, Colombo 12.
Web Site : www.justiceministry.gov.lk Phone : 011 2431841 Fax : 011 2435294

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்
**GOVERNMENT ANALYST'S DEPARTMENT**

අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
இல. 31, இசுரு மாவத்தை, பெலவத்த, பத்தரமுல்லை.
No. 31, Isuru Mawatha, Pelawatta, Battaramulla.
SRI LANKA.

දුරකථන / தொலைபேசிகள் / Telephones: 011 - 2786395, 011 - 2176800
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2786394
E-mail : govanalyst@sltnet.lk

මගේ අංකය / எனது இல. / My No.: ආ.ර.ප./මත්ද්‍රව්‍ය/1/2020
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2020.11.09

නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව.

<u>විශ්ලේෂණය සඳහා ලැබෙන හෙරොයින් සාම්පල වල සංශුද්ධ හෙරොයින් ප්‍රතිශතය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් අද දින පැවැත්වූ දුරකථන සංවාදය හා සබැඳේ.

02. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මත්ද්‍රව්‍ය අංශය වෙත විශ්ලේෂණය සඳහා ලැබෙන ග්‍රෑම් 2 දක්වා දළ බරක් සහිත හෙරොයින් සාම්පල වල විශ්ලේෂණ ප්‍රතිඵල අනුව ඒවායේ,

I. සංශුද්ධ හෙරොයින් මිලි ග්‍රෑම් 500 ඉක්මවන අවස්ථා ඉතා අඩු වන අතර එය 5% පමණ වන බවද,

II. සංශුද්ධ හෙරොයින් මිලි ග්‍රෑම් 1000 ( ග්‍රෑම් 1 ) ඉක්මවන අවස්ථා ඉතාමත් විරල වන අතර එය සියයට එකකටත් වඩා අඩු ප්‍රතිශතයක් බවද,

දන්වා සිටිමි.

ඩී.එච්.එල්.ඩබ්ලිව්. ජයමාන්න
ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක

D.H.L.W. JAYAMANNE
B.Sc.sp. (Hons), M.Sc., C.Chem., F.I. Chem.C.
Additional Government Analyst
Government Analyst's Department
No. 31, Isuru Mawatha,
Pelawatta, Battaramulla.